IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - I කොටස - 2015/2016

(ප්‍රථම සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2017 නොවැම්බර්)

## BLE 103 - ලේඛනත්වය සහ සන්නිවේදනය

**අපේක්ෂකයින්ට උපදෙස් :**

1 **එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් (02) තෝරා ගෙන ප්‍රශ්න <u>පහකට (05)</u> පමණක් පිළිතුරු සපයන්න.**

2 මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් හා ප්‍රශ්න දහයකින්ද, (10) පිටු දෙකකින්ද (02) සමන්විත වේ.

3 කාලය පැය තුනයි. (03)

4 පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

5 ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණය වී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

## 1 කොටස

1. මානව සන්නිවේදනයේ සංවර්ධනය පිළිබඳ යුග දක්වා එයින් එක් යුගයක වැදගත්කම සාකච්ඡා කරන්න.

2. <u>එක්කෝ</u>

භාෂණය හා ලේඛනය වශයෙන් මානව භාෂාවේ ප්‍රධාන ප්‍රභේද දෙකකි. සිංහල භාෂාව ඇසුරෙන් පැහැදිලි කරන්න.

<u>නැතහොත්</u>

'කට වහර ලේඛනයට ගත හැකිය' මෙම මතයට පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න.

3. 'යටිකුරු පිරමිඩ ආකෘතිය' යනු කුමක්දැයි පැහැදිලි කොට පහත සඳහන් ප්‍රවෘත්ති වාර්තාව එම ආකෘතිය අනුව විවරණය කරන්න. සුදුසු සිරස්තලයක් ද යොදන්න.

රජරට රැජින සීඝ්‍රගාමී දුම්රිය 14 වැනිදා රාත්‍රි 8.45 ට පමණ මැදවච්චිය හා පරසන්ගහවැව දුම්රිය ස්ථාන අතරදී පිලී පැනීම නිසා උතුරු දුම්රිය මාර්ගයේ දුම්රිය ධාවන කටයුතු අනුරාධපුර දුම්රිය ස්ථානය දක්වා පමණක් සීමා වී තිබේ.

මෙම තත්ත්වය නිසා උතුරේ දුම්රිය මගීන් දැඩි දුෂ්කරතාවකට මුහුණපා සිටින අතර දුම්රිය දෙපාර්තමේන්තුව සඳහන් කළේ 15 වැනිදා (ඊයේ) ඇතුළත පිලී පනින ලද දුම්රිය නැවත පිලී ගත කොට උතුරු දුම්රිය මාර්ගයේ දුම්රිය ධාවනය යථා තත්ත්වයට පත් කළ හැකි බවයි.

කොළඹ කොටුවේ සිට අනුරාධපුර දක්වා දුම්රිය ධාවනය යථා පරිදි සිදු වුවත් මෙම වන විට කන්කසන්තුරේ සිට අනුරාධපුරය දක්වා දුම්රිය ධාවනය වීමක් සිදු නොවේ.

( දිවයින 2017 නොවැම්බර් 16)

4. 'ගුවන් විදුලි බස කට වහරට සමීප විය යුතුය.' විමසන්න.

5. පහත සඳහන් මාතෘකාවලින් <u>දෙකක්</u> පිළිබඳ ව සටහන් ලියන්න.

I මානව භාෂාවේ නිර්වචනය

II වාචා හා අවාචා සන්නිවේදනය

III භාෂා ද්විරූපතාව

IV තිරු ලිපි රචනය

## II කොටස

6. ( අ) අමිශ්‍ර සිංහල ශෝධිය හා මිශ්‍ර සිංහල ශෝධිය අතර පවත්නා වෙනස්කම් පැහැදිලි කරන්න.

(ආ) පහත සඳහන් සිංහල ග්‍රන්ථ නාම අකාරාදි පිළිවෙළට සකස් කරන්න.
බුත්සරණ, සද්ධර්ම රත්නාවලිය, පූජාවලිය, අමාවතුර, ගුත්තිල කාව්‍යය, මුවදෙව්දාවත, සසදාවත, ධර්මප්‍රදීපිකාව, රාජාවලිය, කව්සිළුමිණ

7. (අ) රීත්‍යනුකූල අක්ෂර වින්‍යාසය යනු කුමක්ද ? නිදසුන් දක්වන්න

(ආ) සිංහල අක්ෂර වින්‍යාසයේ ගැටලු ඇති වන අංශ පිළිබඳ ව පැහැදිලි කරන්න.

8. ශාස්ත්‍රීය ලේඛනයක මූලාශ්‍රය සටහන් කිරීමේ ප්‍රධාන ක්‍රම නිදසුන් මගින් පැහැදිලි කරන්න.

9. "උද්ධෘත භාවිතය ශාස්ත්‍රීය ලේඛනයක මූලික ලක්ෂණයකි." විමසන්න.

10. පහත සඳහන් මාතෘකාවලින් <u>දෙකක්</u> පිළිබඳව සටහන් ලියන්න

I සිංහල අක්ෂර මාලාවේ ප්‍රතිසංස්කරණ

II න ණ ල ළ භේදය

III පාරිභාෂික පද

IV ලේඛන ප්‍රභේද

( ලකුණු 20 X 5 = 100)